www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මහා බලවතුන්ගේ පසමිතුරුතාවන් සහ නැබියුකෝ ගෑස් නලමාර්ග ව්‍යාපෘතිය

## Great power rivalries and the Nabucco pipeline project

නොයෙල් ග්‍රීන් විසිනි.

**2009 අගෝස්තු 01.**

යුරෝපානු සංගමය සහ එක්සත් ජනපදය විසින් පිටුබලය සැපයූ ප්‍රමුඛ යුරෝපානු බලශක්ති සමාගම් කීපයක් විසින් කැස්පියන් මුහුදේ සිට බටහිර යුරෝපය දක්වා දිවෙන නවතම ප්‍රධාන ස්වභාවික ගෑස් නල මාර්ග පද්ධතියක් ඉදිකිරීමේ ගිවිසුමකට පසුගිය මාසයේ දී අත්සන් තැබූහ.

යුරෝ බිලියන 7.9 ක් හෙවත් ඩොලර් බිලියන 11 ක ව්‍යාපෘතියක් වන නැබුයුකෝ නල මාර්ගය යෝධ ඔස්ට්‍රියානු බලශක්ති ප්‍රභව මධ්‍යස්ථානයකින් කෙලවර වීමට ප්‍රථම තුර්කිය, බල්ගේරියාව, රුමේනියාව සහ හන්ගේරියාව හරහා දිවෙනු ඇත. මෙම රටවල ආන්ඩුවේ නියෝජිතයන් විසින් පසුගිය ජුලි 13 වෙනි දින තුර්කි අගනුවර වන ඇන්කාරාහි දී ගිවිසුමට අත්සන් තැබූහ.

සෙනෙට් සභික රිචර්ඩ් ලියුගර් ඇමරිකා එක්සත් ජනපදය නියෝජනය කරමින් අත්සන් තැබීය. ජර්මානු බලශක්ති ප්‍රභව සමාගමක් වන ආර්ඩබ්ලිව්ඊ ද ව්‍යාපෘතියේ ප්‍රමුඛ කොටස් කරුවෙකි.

බැඳීම්වලින් නිදහස් වූ යන තේමාව රැගත් වර්ඩි ඔපෙරාවෙ ඇඟවුම් කරන ව්‍යාපෘතියේ නාමය වන, නැබුයුකෝ, යන්න ප්‍රකටව ම මධ්‍යම ආසියාවේ ගෑස් සැපයුම් කෙරෙහි වන රුසියානු ආධිපත්‍ය විදහා දක්වයි.

යුරෝපානු සංගමය නියෝජනය කරමින්, යුරෝපානු සංගමයේ ප්‍රධානී, ජෝසේ මැනුවෙල් බරෝසෝ විසින් අත්සන් තැබී ය. "කැස්පියන් මුහුදුබඩ රාජ්‍යයන් සහ යුරෝපානු සංගමය, තුර්කිය අතර නව ව්‍යූහාත්මක බැඳීම් ස්ථාපිත කිරීමට හවුල් වීමට බලශක්තියට හැකි" යයි රැස්ව සිටි නිලධාරී පර්ෂදයට සහ මාධ්‍ය වෙත බරෝසෝ ප්‍රකාශ කලේ ය.

නල මාර්ගය සඳහා අරමුදලට තමන්ගේ සහය ලබාදීම පිලිබඳ සථප කල යුරෝපානු සංගමය, කැස්පියන් කලාපයේ අනෙකුත් යටිතල පහසුකම් සඳහා විශේෂයෙන්, නැබුයුකෝ හරහා ගමන් කිරීමට නියමිත ගෑස් ප්‍රවාහයෙන් විශාල ප්‍රමානයක් උත්පාදනය කරනු ඇති, පූර්ව-සෝවියට් සංගමයේ අසර්බයිජානයට දැවැන්ත මුදල් ආධාර පිරිනැමී ය.

නල මාර්ගයෙන් ලාභ උත්පාදනය කිරීම පිලිබඳ මූල්‍යමය සැක සංකාවන් හේතුවෙන්, යුරෝපානු ආයෝජන බැංකුව සහ ප්‍රතිසංස්කරනය සහ සංවර්ධනය සඳහා වන යුරෝපානු බැංකුව ව්‍යාපෘතිය සඳහා වැය වන සමස්ථ වියදමෙන් කොටසක් පමනක් මුදල් යොදවනු ඇත.

ජෝර්ජියාව ඔස්සේ තුර්කිය වෙතට ගෙන යනු ඇති, කැස්පියන් කලාපයේ ගෑස්වලට අතිරේකව, නැබුයුකෝ, ඉරාකය, ඉරානය සහ සිරියාව වෙතින් ගෑස් සපයා ගනු ඇත.

මෙම ප්‍රභවයන් වෙතින් වසරකට ස්වාභාවික ගෑස් කියුබික් මීටර් බිලියන් 31 ක් 2014 සිට ඔස්ට්‍රියාවට ප්‍රවාහනය කිරීමට නැබුයුකෝ බලාපොරොත්තු වේ. ව්‍යාපෘතිය සඳහා අවසන් සැලසුම් මාස 6 ක් ඇතුලත අත්සන් කරනු ඇති බවට, තුර්කි අගමැති රිසෙප් අර්ඩගැන් නිවේදනය කලේ ය.

දැනට යුරෝපානු ගෑස් අවශ්‍යතාවන්ගෙන් වැඩිමනත් ප්‍රමානයක් සපයමින් සිටින, රුසියන්-අධිකාරීවත් පද්ධතියට විකල්ප සැපයුම් මාර්ගයක් සපයා ගැනීමට නව නල මාර්ගය අරමුනු කොට තිබේ. මෙම වසරේ මුල, රුසියානු ගෑස් අධිකාරී ගෑස්ප්‍රොම් සහ යුක්රේනියන් ආන්ඩුව අතර ඇති වූ ආරවුලක් යුරෝපයේ ඇතැම් කොටස් වෙත ගෑස් සැපයුම අඩාල කිරීමට මෙහෙයවිනි.

ගෑස්ප්‍රොම් විසින් කලාපය තුල, සවුත් ස්ට්‍රීම් 'දකුනු ධාරාව' යැයි හඳුන්වන තමාගේ නව නලමාර්ග පද්ධතිය සැලසුම් කිරීමෙන් නැබුයුකෝ ව්‍යාපෘතියට ප්‍රතිචාර දැක්වුවේ ය. යෝජිත නල මාර්ගය, මධ්‍යම ආසියාවේ සිට රුසියාව සහ බෝල්කන් කලාපය හරහා බටහිර යුරෝපයට ගෑස් ගෙන යාමට නියමිතය. වසර

2015 දී සක්‍රීය තත්ත්වයට ඒමට නියමිත "දකුනු ධාරාව" ව්‍යාපෘතියට යුරෝපියානු සාමාජිකයන් වන ඉතාලිය හා බල්ගේරියාව සහාය දැක්වීය. රුසියාවේ දැවැන්ත නල මාර්ග පද්ධතිය සහ මධ්‍යම ආසියාවේ දේශපාලන සබඳතාවන් යොදාගනිමින්, දකුනු ධාරාව මගින් නැබුයුකෝ සහ දැනට පවතින දකුනු කොකේසියන් ගෑස් නල අඩාල කිරීමට හැකිය.

කෙසේවෙතත්, ව්‍යාපෘතිය සඳහා විශාල වියදමක් කිරීමට සිදුවනු ඇති අතර, ගෑස්ප්‍රොම් එය සොයා ගනු ඇත්ද යන්න අපැහැදිලිය. මේ පිලිබඳ රුසියානු පුවත්පතක්වන *කොමර්සාන්ට්* පහත අයුරින් අදහස් දැක්වීය. "නැබුයුකෝ ව්‍යාපෘතිය, ප්‍රායෝගිකව ම සමස්ථ යුරෝපයේ ම ශක්තිමත් දේශපාලන සහය ලැබී තිබීමේ කාරනාවට ස්තූතිවන්නට දකුනු ධාරාව ව්‍යාපෘතියට වඩා ඉදිරියෙන් සිටීමේ කාරනාව ප්‍රකටව පැහැදිලි වෙමින් තිබේ."

"ගෑස්ප්‍රොම්හි අදහස, දකුනු ධාරාවට එවැනි ශක්තිමත් දේශපාලන සහයක් පිලිබඳ පාරම්බෑමට හැකියාවක් නැත යි" පුවත්පත තවදුරටත් අදහස් කලේ ය.

ඒ අතරතුර, ගෑස්ප්‍රොම් මධ්‍යම ආසියාවේ බලශක්ති ප්‍රභවයන් අපනයනය කෙරෙහි වන තමන්ගේ පාලනය ශක්තිමත් කිරීමට ක්‍රියා කලේ ය. මෑතක දී තමන්ගේ ගෑස් සංචිත තුන් ගුනයකින් ඉහල දමා ගනිමින්, ස්වභාවික ගෑස් සංචිත හිමි ලොව හතරවැනි විශාලතම ගෑස් හිමියා වන ටර්ක්මෙකිස්ථානය ද ඇතුලත් කරගනිමින්, රුසියානු සමාගම ප්‍රධාන ගෑස් අපනයන රටවල් සමග නව බලශක්ති සැපයුම් ගිවිසුම්වලට මෑතකදී අත්සන් තැබීය.

මධ්‍යම ආසියාවෙන් බලශක්ති අපනයන් පිලිබඳ රුසියන් ආධිපත්‍යය විසින් බොහෝමයක් කර්මාන්ත විශ්ලේෂකයන් නැබුයුකෝ ව්‍යාපෘතියේ ශක්‍යතාව පිලිබඳ ප්‍රශ්නයට බඳුන් කිරීමට මෙහෙයවා ඇත. "ගෑස් ලබා ගැනීමේ හැකියාවක් නැත", මොස්කව් හි ඩොයිස්ච බැංකුවට (ඒජීට) ගෑස් පර්යේෂනය පිලිබඳ අධ්‍යක්ෂක පාවෙල් කුෂනිර් බ්ලූම්බර් පුවත් ඒජන්සියට ප්‍රකාශ කලේ ය. "එක්තරා ලක්ෂ්‍යයක දී ටර්ක්මෙකිස්ථානය ව්‍යාපෘතියට සම්බන්ධ වී ව්‍යාපෘතියට අඛන්ඩව ගෑස් සපයනු ඇතැයි නැබුයුකෝ ව්‍යාපෘතියට දිගින් දිගටම බලාපොරොත්තු තැබීමට සිදුවනු ඇත."

නැබුයුකෝ වෙත සැපයුම් සඳහා ටර්ක්මෙනිස්ථානය එකඟතාව පලකලත්, අසර්බයිජානය සමග පවතින කලාපීය ගැටුම් හේතුවෙන්, ටර්ක්මෙනිස්ථානය ගෑස් අතරමඟ දී ඉරානය ඔස්සේ තුර්කියට ප්‍රවාහනය කිරීමට සිදුවනු ඇත.

අසර්බයිජානයේ සිට එර්සරම් Erzurum පලාතේ තුර්කි ගෑස් මධ්‍යස්ථානය කරා දිවෙන, දකුනු කොකේසියන් මාර්ගය ඔස්සේ ඇති ගෑස් නල මගින් නැබුයුකෝ තම සැපයුම් ලබා ගනු ඇත. එහෙත් ආර්ථිකමය වශයෙන් වැදගත් වීමට නම්, ඉරානයේ යෝධ ගෑස් ක්ෂේත්‍රයන් තුර්කිය සමග යාකරන, ටබ්රිස්-එර්සරම් Tabriz-Erzurum නල මාර්ගයේ විශ්වාස කටයුතු ගෑස් සැපයුමක් තිබීම ද අවශ්‍ය කාරනාවකි.

එවැනි අවශ්‍යතාවන් ඉරානයේ ඇමරිකානු සහ යුරෝපියානු යාන්ත්‍රනයන් සඳහා පසුබිම සකසා දෙයි. සීඝ්‍රයෙන් වර්ධනය වන තෙල් සහ ගෑස් අපනයන හරහා තමාගේ දැවැන්ත මුදල් කන්දරාව වැඩි කර ගැනීමේ උපායන් වශයෙන් බටහිර සමග වර්ධනය කරගැනීමට ඉරාන-පූජක ව්‍යාපාරික තන්ත්‍රයන් උපාමාරු දමමින් සිටි අතරේ, අධිරාජ්‍යවාදී බලයන් තමාගේ බලශක්ති ප්‍රතිපත්තීන් සමග එකට ගනුදෙනු කල හැකි පාලනයක් ටෙහෙරානය තුල බිහි කිරීමට කල් යල් බලති.

මීර් හුසෙයින් මවුසාවිගේ බටහිර-ගැති ව්‍යාපාරය වෙත තමන්ගේ සහය පලකරමින්, ඉරාන මැතිවරනයට එක්සත් ජනපදයේ සහ යුරෝපානු බලවතුන්ගේ මෑත ම මැදහත් වීමේ ප්‍රේරක බලයක් වූයේ, නියත ලෙසම, රුසියාවට ප්‍රතිපක්ෂ වූ බලයක් ඇති කරමින්, බටහිර යුරෝපියානු ගෑස් අවශ්‍යතාවන්ගෙන් විශාල කොටසක් ඉරාන ගෑස් මගින් සපයා ගැනීමට හැකිව තිබිමේ කාරනාවෙනි.

කැස්පියන් කලාපයේ බලශක්ති කාරනාවන් පිලිබඳ ජනාධිපති බරාක් ඔබාමාගේ විශේෂිත නියෝජිත, රිචර්ඩ් මෝනිංග් ස්ටාර් මෑතක දී මාධ්‍යය වෙත ප්‍රකාශ කලේ, නැබුයුකෝ ව්‍යාපෘතියේ ඉරාන හවුල්කාරීත්වයට වොෂිංටනය පිටුබලය නොදුන් බවයි. "ඉරානය නැබුයුකෝ ව්‍යාපෘතියේ හවුල්කරුවෙකු විය යුතු යැයි අපි අද විශ්වාස නොකරන්නෙමු." කෙසේවෙතත්, මෙහිදී "අද" යන වචනය වැදගත් ය.

ඇමරිකන් - හිතැති නූරි-අල්-මලිකිගේ ඉරාක ආන්ඩුව, නැබුයුකො වෙනුවෙන් වසරක ස්වාභාවික ගෑස් කියුබික් මීටර් බිලියන 500 ක් සැපයීමට ප්‍රතිඥා දී තිබින.

යෝජිත නැබුයුකෝ ගෑස් නල මාර්ගය සහ පාලක දකුනු කොකේසියානු මාර්ගයට මෙන් ම, එක්සත් ජනපදය සහ යුරෝපානු සංගමය විසින්, කැස්පියන් කලාපයේ සිට තුර්කියේ ගිනිකොන දිග මධ්‍යධරනී වෙරල දක්වා දිනකට තෙල් බැරල් මිලියනයක් ප්‍රවාහනය කරන, බාකු-ටිබිලිසි-වෙයිහාන් නල මාර්ගයට අනුබල දුන්හ. ෂෙව්රොන්, බීපී සහ ටෝටල් යන සමාගම් ද ඇතුලත් ව ලෝකයේ විශාලතම සමාගම් වලින් කීපයක් සම්බන්ධ කරගනිමින්, මෙම මාර්ගයන් සහ ඒවා දිවෙන කලාපය, ප්‍රමුඛ බලවතුන්

හට, වැදගත් ආර්ථික සහ මූලෝපායික අවශ්‍යතාවන් පිලිබඳ අතිශය වැදගත් ය.

ස්ටැලින්වාදී නිලධාරී තන්ත්‍රය විසින් සෝවියට් සංගමය දියකර හැරීම, යුරෝපියානු බලවතුන්ට සහ එක්සත් ජනපදයට පැරනි සෝවියට් සමුහාන්ඩුවල දැවැන්ත බලශක්ති සම්පත් මංකොල්ලකෑමට මංපෙත් විවර කර දුනි. 1990 ගනන්වල දී රුසියානු පාලක තන්ත්‍රය, අවබෝධ කර ගනු ලැබුවේ, එය විසින් පැරනි සෝවියට් සමුහාන්ඩුවල "සමීප ප්‍රත්‍යන්ත" වශයෙන් හඳුන්වනු ලැබූ ප්‍රදේශයේ වඩ වඩාත් තමන් සිර වී යන බවයි.

ධනවාදය පුනස්ථාපනය සමග එකට බැඳුන ආර්ථික සහ දේශපාලන වියවුල තමන්ගේ ස්වාධීන අවශ්‍යතාවන් ඉදිරියට දැමීමට යත්තමින් සන්නද්ධ වූ ක්‍රෙම්ලිනයට ඉතිරිකර තිබින. තමාගේ ම දේශ සීමා ඇතුලත දී පවා, විදේශීය බලශක්ති සමාගම් සඳහා ඉන්ධන සහ ගෑස් උකහා ගැනීමට ඉහලින් ලාභ උපයන ගිවිසුම්වලට එලඹීමට හැකියාව පැවතුනි. කෙසේ වෙතත්, පසුගිය දශකය පුරා රුසියානු පාලන තන්ත්‍රයට තමාගේ ම ස්වභාවික සම්පත් අපනයන සහ තම මධ්‍යම ආසියානු අසල්වැසියන් කෙරෙහි එහි ආධිපත්‍ය ව්‍යාප්ත කිරීමට හැකියාව ලැබිනි.

මිලිටරි ගැටුම් සහ රාජ්‍යතාන්ත්‍රික උපාමාරු පිටුපස ප්‍රේරිත බලය උපයෝගිකර ගනිමින්, කැස්පියන් සහ කොකේසියානු කලාප තුල අධිපත්‍ය සියලුම ප්‍රමුඛ බලවතුන්ට අතිශය වැදගත් ය. යුරෝපියානු බලවතුන්ට මෙන්ම, වඩාත් ප්‍රකෝපකාරී ලෙස වොෂිංටනයට කලාපයේ රුසියානු පාලනය බිඳීමට අවශ්‍යය. මෙය වනාහි රුසියානු පාලන තන්ත්‍රය විසින් ඉඩ නොදෙන අපේක්ෂාවක් වන අතර, තමන්ගේ එදිරිවාදීන්ට සමාන නිර්දයභාවයකින් තම අවශ්‍යතාවන් ඉදිරියට දැමීමට සහ ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කරමින් සිටී.

බටහිර බලයන් විසින් ජෝර්ජියාව සහ අසර්බයිජානය වැනි දූප්පත් රටවල් සඳහා, සාමාන්‍යයෙන් ඒවායේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් මෙන්ම දූෂිත මැතිවරන කෙරෙහි සිය දෙනෙත් වසා ගනිමින්, දැවැන්ත සිවිල් සහ මිලිටරි ආධාර සපයනු ලබයි. පිලිවෙලින්, රුසියාව තමන්ගේ අවශ්‍යතාවන් ඉදිරියට දමා ගැනීමට තම මිලිටරි සහ දේශපාලන අධිකාරය යොදා ගනියි.

මෙය, පසුගිය වසරේ අගෝස්තු මාසයේ දී රුසියාව සහ ජෝර්ජියාව අතර යුද්ධය තුලින් තියුනු ලෙස ප්‍රකාශයට පැමිනි අයුරින්, රුසියාව සහ බටහිර බලවතුන් විශේෂයෙන් එක්සත් ජනපදය සමග ඝට්ටනයේ මාවතකට ප්‍රවේශ කොට තිබේ. එක්සත් ජනපද පිටුබලය ලත් ටිබිලිසි පාලනය, රුසියානු පිටුබලය ලත් ජෝර්ජියාවෙන් බිඳුන දකුනු ඔසෙටියා පලාතට ප්‍රහාර එල්ල කල මොහොතේ, රුසියාව ආක්‍රමනකාරී හමුදාව මගින් ප්‍රතිචාර දැක්වීය. මචිතයට පත් එක්සත් ජනපදය තම ජෝර්ජියානු සේවාදායකයාට සෘජුව ම ආධාර කිරීම ප්‍රතික්ෂේප කල නමුත්, රුසියන් බ්ලැක් සී ජ්ලීට් ධජය දරන නැව සරන මුහුදු ප්‍රදේශයට ම නාවුක සේනාංකයක් පිටත් කර යැවී ය.

යුද්ධයේ ප්‍රථිඵලයක් වශයෙන්, දකුනු කොකේසියානු ගෑස් නල මාර්ගය සහ වැදගත් දේශීය තෙල් නල මාර්ගයක්, මෙහෙයුම් ක්‍රියාකරු, බ්‍රිතාන්‍ය පෙට්‍රෝලියම් සමාගම විසින් තාවකාලිකව වසා දමනු ලැබී ය.

මිකායිල් සාකාස්විලිගේ ජෝර්ජියානු ආන්ඩුවට මිලිටරිමය වශයෙන් අන්ත පරාජයක් උදාකල ගැටුමත් සමගම, දකුනු ඔසෙටියාව සහ අබ්කාසියාව විසිරී ගිය ජෝර්ජියා පලාත්වල තම පාලනය සැලකිය යුතු ආකාරයක බලපෑමකින් ව්‍යාප්ත කිරීමට මොස්කව්වලට අවකාශ උදාකර දුන්නේ ය.

රටතුල සහ කලාපයේ රුසියානු ආධිපත්‍ය දූර්වල කිරීම පිනිස එක්සත් ජනපද අනුබලය ලත් "රෝස විප්ලවය" ඔස්සේ සාකාස්විලි බලයේ පිහිට වූ වොෂිංටනය, පුනර්ජීවක රුසියාවකට දීර්ඝ කාලයක් තිස්සේ එහි රැඳී සිටීමට අවසරදීමට ඉඩ දෙන්නේ නැත.

ඔබාමා පාලන තන්ත්‍රය ඇෆ්ගනිස්ථානයේ දී ගෙන යමින් පවතින යුද ධාවනයට ක්‍රෙම්ලිනයේ සහය ලබා ගැනීමට රුසියාව සමග "ප්‍රතිසංවිධාන" සබඳතාවන්ට මේ මොහොතේ දී මං සොයමින් සිටින අතර-පාර්ශවීය වශයෙන් ජෝර්ජියාව සහ යුක්රේනය නේටෝව වෙත ඇතුලත් කරගැනීමේ ඉල්ලුම්පත් පසෙක තබමින්- වොෂිංටනය සහ මොස්කව් අතර ආතතීන් තවමත් උත්සන්න මට්ටමක පවතී.

පසුගිය සතියේ ජෝර්ජියාවට සහ යුක්රේනයට කල සංචාරයෙන් පසුව එක්සත් ජනපදයට පෙරලා පැමිනි උප ජනාධිපති ජොසෆ් බිඩෙන් වෝල් ස්ට්‍රීට් ජර්ලනයට කතා කලේ ය. ඉහල ම රාජ්‍ය තාන්ත්‍රික - නොවන බසකින්, රුසියාව "නිර්දය" සතුරෙක් ලෙසට බිඩෙන් විසින් සමච්චලයට ලක් කලේ ය.

"අප අල්ලා ගෙන තිබෙන අත අප විසින් ඉහලින්ම අවතක්සේරු කර ඇත්තෙමු", ඔහු කීවේ ය. "ලෝකය තමා ඉදිරියේ වෙනස් වෙමින් පවතින තත්ත්වයක ඔවුන් පසුවෙන අතර, ශේෂ වී නොමැති අතීතයේ කිසිවකට ඔවුන් ලොබ බැඳ සිටිති."

සෝවියට් සමාජවාදී සමුහාන්ඩු සංගමය මගින් උරුම කර ගනු ලැබූ පරමානුක ආයුධ රුසියාවට රැකගත නොහැකිවෙනු ඇතැයි උප ජනාධිපති තවදුරටත් ප්‍රකාශ කලේ ය.

මාධ්‍යයන්ගෙන් බොහෝමයක් විසින් මෙම විවේචනයන් හුදු කටමැත දෙඩවීමක් වශයෙන්

නිරූපනයට උත්සහ දැරූ අතරේ, ඒවා රුසියාව සමග ඇමරිකන් අධිරාජ්‍යවාදයේ සබඳතාවයන් පිලිබඳ වොෂිංටනයේ සැබෑ ආස්ථානයන් ප්‍රකාශයට පත් කරයි. ඇෆ්ගනිස්ථානය සහ උතුරු පාකිස්ථානයේ එක්සත් ජනපද ආක්‍රමනයන්ට ආධාර අනුබල දෙමින් ප්‍රයෝජනවත් කාර්යයක් රුසියාවට ඉටු කල හැකි තාක් දුරට, ධවල මන්දිරය ක්‍රෙම්ලිනයේ ආභිලාෂයන්ට සැලකිය යුතු දීමනාවක් ගෙවනු ඇත. කෙසේ වෙතත්, අඛන්ඩව දුර්වලභාවයේ පසුවන රුසියන් ආර්ථිකය සහ මිලිටරියේ වාසිය තමාට ගැනීමට පැරනි සෝවියට් කලාපයේ සහ රුසියාව තුලමත් තම අවශ්‍යතාවන් බලකිරීමට වොෂින්ටනය කැසකවමින් සිටී.

අඟහරුවාදා දින ජර්නලයේ කර්තෘ වාක්‍යයකින් බිඩෙන්ගේ අදහස්වලට උද්යෝගී සහයක් ලැබුවේ ය. ඒවා උපුටා දක්වමින් මොස්කව්වලට මොනයම්ම හෝ සහනයක් දීමට එරෙහිව තර්ක කරමිනි.

රුසියාවට මොනයම්ම හෝ අයුරකින් තමන්ගේ අවි තොග පාලනය කල නොහැකි නම්, එක්සත් ජනපදය පරමානුක ආයුධ කුඩා සංඛ්‍යාවක් සහ වාහන බෙදාහැරීම නව ආයුධ ගනුදෙනුවල දී බෝම්බ සහ මිසයිල වැනි දේවල් සඳහා සීමාවක් කුමට ද? මොස්කව්හි වත්මන් පාලනය අධිකාරය යලි අත්කර ගැනීමේ සිහින දකිමින් අතීතයේ ජීවත් වන්නේ යැයි උප ජනාධිපතිවරයා සඳහන් කරද්දීත් පෝලන්තයේ සහ චෙක් සමුහාන්ඩුවේ මිසයිල ආරක්ෂක වැඩ පිලිවෙල අත්හැර දැමීමේ අභිලාෂයක් පිලිබඳ ඉඟි කරමින්, නැගෙනහිර යුරෝපයේ තම "වරප්‍රසාදිත අවශ්‍යතාව" පිලිබඳ රුසියානු මිත්‍යාවට ඉඩ දෙන්නේ ඇයි ? ප්‍රධාන වශයෙන්ම, අනෙක් අතට මෙම සහනයන් වෙනුවෙන් එක්සත් ජනපදය "රුදුරු" හවුල්කරුවෙකුට ලබා දීමට බලාපොරොත්තු වන්නේ කුමක් ද?

බිඩෙන්ගේ විවේචනවල සැරබාල කිරීමේ අරමුනින්, රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් එන්බීසී යේ "මාධ්‍ය හමුව" වැඩ සටහනට කියා සිටියේ, පාලන තන්ත්‍රය විසින් රුසියාව "මහා බලවතෙක්" ලෙස සලකන බවයි. ඒ අතරම පාලක කවය අතර මොස්කව් කෙරේ වඩාත් විවෘත ගැටුම්කාරී ප්‍රවේශයකට ලැදි කොටස් සතුටු කිරීම සඳහා එකතු කර සිටියේ, "අපගේ ක්‍රියාමාර්ගයන් පිලිබඳ ඔවුන්ට ප්‍රශ්න තිබෙන අතර ඔවුන්ගේ ඇතැම් ක්‍රියාමාර්ගයන් පිලිබඳව අපට ද ප්‍රශ්න තිබේ" යනුවෙනි.

පසුදින *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පුවත්පත, පාලන තන්ත්‍රයේ ප්‍රවේශයට ලැදිව, "රුසියාවේ බලාධිකාරය, සෝවියට් සංගමයේ දිනවල පටන් ම ඉමහත් ලෙස පල්ලම් බැස තිබුනත්, එක්සත් ජනපදයට ඉරානය, උතුරු කොරියාව, ඇෆ්ගනිස්ථානය සහ අරාබි-ඊස්රායල ගැටුම සමග ගනුදෙනු කිරීමේ දී මොස්කව් හි සහයෝගය අතිශයින් වැදගත් ය."

ලෝක සම්පත් කෙරෙහි එකිනෙකාගේ පාලනය සඳහා ප්‍රතිමල්ලව ජාතික තන්ත්‍රයන් අතර කලහයේ දී පුනර්ජීවක ස්විචයක් ඇත්තේ නැත. එක්සත් ජනපදය තමන්ගේ ප්‍රධාන ප්‍රතිමල්ලවයන්ට මුහුන ලා මිලිටරි ක්‍රමෝපායන් මගින් තම ආර්ථික කඩාපාත් වීම හැරවීමට දරන උත්සාහය විවෘත ගැටුමක් කරා මෙහෙය වී තිබීම අනිවාර්ය තර්කනයකි.

© www.wsws.org